# චන්ද්‍රිකා හා ශ්‍රී ල නි ප අනාගතය

දෙමළ ජනයාට 1983 දී කළ හිරිහැර සම්බන්ධයෙන් ජනාධිපතිනිය සමාවක් ගෙන ඇත. ඇයට ඒ සමාව ලැබුණේ දැයි අපි නොදනිමු. ඒ වසරේ දී එ ජා පක්‍ෂයේ ඇතැම් දේශපාලනඥයන්ගේ මැදිහත්වීමෙන් ඔවුන්ගේ මැරයන් විසින් කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් රටේ ජනාධිපතිනිය ලෙස සමාව අයැදින විට ඇය එමගින් මුළු මහත් සිංහල ජාතියට ම නිග්‍රහයක් කර ඇත. මහජන පක්‍ෂයේ සාමාජිකාවක් ලෙස සිය සිංහල බෞද්ධ විරෝධී සැමියා සමගින් දෙමළ ත්‍රස්තවාදීන්ගේ කඳවුරුවල සැරි සැරූ ඇය තවමත් ගතින් කෙසේ වෙතත් සිතින් ඇත්තේ මහජන පක්‍ෂයෙහි ය. මෙරට ඇති ප්‍රධාන ම ප්‍රශ්නයක් නම් මහජනයා විසින් ප්‍රතික්‍ෂෙප කරනු ලැබූ පක්‍ෂයක ප්‍රතිපත්ති ශ්‍රී ල නි පක්‍ෂය ඔස්සේ ක්‍රියාත්මක කරවීමට රාජ්‍ය නොවන සංවිධාන සමත් වීම ය. 1992 දී විජාතික බලවේග විසින් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය මෙරටට ගෙන්වා අවුල් කරන ලද ජාතිකවාදී දේශපාලනය නිසි මග යැවීමට තවත් අවුරුදු දෙකක පමණ කාලයක් බලා සිටීමට සිදු වී ඇත. එහෙත් ඒ කාලය තුළ ශ්‍රී ල නි පක්‍ෂයට කුමක් සිදුවිය හැකි ද?

පසුගිය වසර සියයකට අධික කාලයක් තිස්සේ සිංහලයන්ට කරන ලද අසාධාරණයන් පිළිබඳ ව ජනාධිපතිනිය සමාව ගන්නේ දැයි දැනගැනීමට නො හැකි ය. ඇය එසේ කරාවි යැයි සිතිය නො හැකි ය. ශ්‍රී මහා බෝධීන් වහන්සේ අසළ කරන ලද ඝාතන, අරන්තලාවේ භික්‍ෂූන් වහන්සේ ඝාතනය කිරීම, ගම්වලට වැද ළදරුවන් ඇතුළු අහිංසක ගැමියන් ඝාතනය කිරීම, බෝම්බ පුපුරුවා හැර කරන ලද ඝාතන සහ තවත් නොයෙකුත් ඝාතන සම්බන්ධයෙන් ජනාධිපතිනියට කීමට ඇත්තේ කුමක් ද? ඊනියා කළු ජුලියක් එ ජා පාක්‍ෂිකයන් පිරිසකගේ අවශ්‍යතාවට නිර්මාණය වී ඇත්තේ එක්වරකි. එහෙත් එදා සිට සෑම මාසයක් ම පාහේ සිංහලයන්ට කළු මාස බවට පත්වී ඇත.

එක් අතකට ගත්කල ජනාධිපතිනියගේ සමාව ගැන එතරම් කලබලවීමට ද කරුණක් නැත. ඇයගේ බොහෝ ක්‍රියා සෝබනවාදී වෙයි. අද මුළු රටේම ඇත්තේ සෝබනවාදී ක්‍රියා බැවින් ජනාධිපතිනිය රටේ නායිකාව ලෙස සෝබනවාදී ක්‍රියාවල නිරතවීමේ ඇති වරද කුමක් දැයි කෙනකුට ප්‍රශ්නකළ හැකි ය. සෝබනවාදයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ක්‍රියාව, වචනයෙන් ද, වචනය සිතිවිල්ලෙන් ද ආදී වශයෙන් වෙන් කිරීම ය. මිනිස්සු සිතන දේ නොකියති. කියන දේ නොකරති. සිත, කය, වචනය ආදී වශයෙන් කුසල් අකුසල් ගැන කෙරෙන විග්‍රහයක් බුදු දහමෙහි වෙයි. අද සිත කය වචනය වෙන්කෙරීමට කටයුතු කෙරෙන අතර ඕල්කට් බෞද්ධයෝ සිතෙන් අකුසල් රැස්කරමින් කයින් කුසල් රැස්කිරීමට උත්සාහකරති. එය වංචාවක් බොරුවක් හා කුහකකමක් මිස අනෙකක් නො වෙයි. සෝබන කුසල් මෙන් ම සෝබන මානව හිතවාදය ද මෙරටට දැන් හොඳට පුරුදු දෑ වෙයි.

කෙසේ වෙතත් ජනාධිපතිනියට සිංහලයන්ගෙන් සමාව ගැනීමට කරුණු රාශියක් වෙයි. දෙමළ ජාතිවාදය විසින් කෙරී ඇති ඝාතනවලට අමතර ව දෙමළ ජාතිවාදය ඔස්සේ මෙරට සිංහලත්වයට හිමි තැන අහිමිකිරීමේ ප්‍රශ්නය අඩු තරමින් ලන්දේසීන්ගේ කාලයේ සිට වෙයි. එයටත් පෙර සිට ම දෙමළ ජාතිවාදයක් නොමැති වුව ද පෘතුගීසීන්ගේ සමයේ සිට සිංහලත්වයට හිමි තැන අහිමිකිරීම මෙරට සිදුවෙයි. මෙරට ප්‍රශ්නය අන්කිසිවක් නොව සිංහලත්වයට හිමි තැන අහිමිකිරීම වෙයි. ඉංගිරිසිකාරයා යනු ක්‍රිස්තියානි සංස්කෘතියක බිහිවූවෙක් වෙයි. ක්‍රිස්තියානියෙන්, එනම් ඇංග්ලිකන් ක්‍රිස්තියානියෙන් මිදුණු ඉංගිරිසිකාරයෙක් නො වෙයි. ක්‍රිස්තියානි සංස්කෘතියෙන් මිදුණු ඉංගිරිසිකාරයකු නැත. තමා ක්‍රිස්තියානිකාරයකු නොවන්නේ මන්දැයි යනුවෙන් පොතක් ලියූ බර්ට්‍රන්ඩ් රසල් පඬිවරයා පවා සංස්කෘතික වශයෙන් ඇංග්ලිකන් ක්‍රිස්තියානිකාරයකු බව මෙරට ඕල්කට් බෞද්ධයනට නො වැටහෙයි. ඕල්කට් බෞද්ධයන් හිතන්නේ රසල් උන්නැහේ ද තමන් මෙන් ම ඕල්කට් බෞද්ධයකු වූ බව ය. එංගලන්තයේ ක්‍රිස්තියානිත්වයට හිමි තැන අහිමි නො කෙරෙයි. බටහිර නූතනත්ව ව්‍යාපෘතිය යනු අන්කිසිවක් නොව මුළු ලෝකය ම අධිපතිවාදී ක්‍රිස්තියානි සංස්කෘතිය යටතට ගැනීම ය.

පෘතුගීසීන් කැලණි විහාරය කඩා දැමීමේ සිට ජනාධිපතිනියගේ සමාව ගැනීම දක්වා සිංහලයන්ට එරෙහිව කර ඇති ක්‍රියා රාශියක් වෙයි. ඒ අතර සිංහලයන්ට ඉංගිරිසින් විසින් බිහිකරනු ලැබූ නායකයන් ලබාදීම ද වෙයි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද එවැනි නායිකාවක් වෙයි. අද ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය ඇගේ නායකත්වය යටතේ ක්‍රමයෙන් දියවෙමින් පවතින බව ඉතා පැහැදිලි ය. 1992 දී ඇය ඇගේ සීයලාගේ මව්රට වූ එංගලන්තයෙන් මෙරටට

© Prof. Nalin De Silva

ගෙන්වාගනු ලැබූ අවස්ථාවෙහි ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට නායකත්වයක් නොතිබුණා නො වෙයි. සිරිමාවෝ බණ්ඩාරණායක මහත්මියට එවකට අපහසුවක් නැතිව පක්ෂයට නායකත්වයක් දීමේ හැකියාව විය. ඇගේ නායකත්වයෙන් තරගකර ජයගැනීමේ හැකියාව ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විය. එහෙත් විජාතික බලවේගවලට අවශ්‍ය වූයේ ඇය පක්ෂ නායකත්වයෙන් නෙරපා හැරීම ය. ඒ සඳහා ඔවුහු නොයෙකුත් කතා ගෙතූහ. ඇගේ වයස ද ප්‍රශ්නයක් විණි. විජාතික බලවේගවල අවශ්‍යතාවය පරිදි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය මෙරටට ආනයනය කරනු ලැබුයේ සිරිමාවෝ බණ්ඩාරණායක මහත්මිය නායකතවයෙන් පළවා හැර දෙමළ ජාතිවාදයට අනුග්‍රහ දක්වන නායකත්වයක් ඇතිකිරීමට ය.

ඇගේ නායකත්ව ගමනට අපි එදා ම විරුද්ධ වූයෙමු. එහෙත් දැන් ඇය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙහි නායකාව වෙයි. විජාතික බලවේග විසින් ශ්‍රී ල නි පාක්ෂිකයනට පෙන්වා දී ඇත්තේ 1994 දී ඇය නිසා පක්ෂ ජයගත් බව ය. එහෙත් ඇය නැතිව නොව ඇය සිටිය දී පවා අද ශ්‍රී ල නි පක්ෂය ප්‍රමුඛ සන්ධානයට ජයග්‍රහණය කළහැකි ය. එහෙත් මේ කෙතරම් කාලයකට ද? ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති ඒ පක්ෂයේ නායකයන් විසින් අමතක කෙරෙන්නේ නම් පාක්ෂිකයන් හා එයටත් වඩා එහි අනුගාමිකයන් හා එයට පක්ෂව ඡන්දය දෙන්නන් පක්ෂය හැර යනු වැළැක්විය හැකි නො වෙයි. ශ්‍රී ල නි පක්ෂයේ නායකයන්ගෙන් බොහෝ දෙනෙක් රාජ්‍ය නොවන සංවිධාන මගින් මෙහෙයවනු ලැබෙති. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගෙන් පසු එවැන්නකු පක්ෂ නායකත්වයට පත්වුවහොත් පක්ෂයේ ඡන්ද පදනම බලා සිටිය දී කඩා වැටෙනු ඇත.

1954 - 55 වන විට ශ්‍රී ල නි පක්ෂය සිංහලත්වයේ පක්ෂය බවට පත්විය. ඒ බන්ඩාරණායක මහතාගේ අවශ්‍යතාවකට වඩා සිංහල බෞද්ධයන්ගේ අවශ්‍යතාවට ය. එහෙත් සිංහලත්වයට මෙරට හිමි තැන අහිමිකිරීමේ ව්‍යාපෘතිය ඔස්සේ පක්ෂ නායකත්වය මෙහෙයවීමට විජාතික බලවේග බොහෝ අවස්ථාවල කටයුතුකර ඇත. පක්ෂයට හා සිංහලත්වයට දර්ශනයක් මතවාදයක් නොමැතිවීම ද විශාල ගැටළුවක් විය. එබැවින් ශ්‍රී ල නි පක්ෂයට ලිබරල්වාදී හා මාක්ස්වාදී මතිමතාන්තර මත පිහිටා කටයුතුකිරීමට සිදුවිය. ඒ මතිමතාන්තරවලට විකල්ප ව පසුගිය කාලයේ ජාතික චින්තනය නමින් නව දැනුමක් මෙරට ගොඩනැගෙමින් පවතියි. ඒ දැනුම මෙරට දේශපාලනයෙහි මෙන් ම අනෙක් ක්ෂේත්‍රවල ද බලපෑම් ඇතිකරයි. එහෙත් විජාතික බලවේග ඒ පිළිබඳ වැරදි විග්‍රහයන් හා කතා පතුරවමින් සිටියි. ඒ අතර අවාසනාවකට එහි විකාශය පිළිබඳව ද වැරදි කතා ජනමාධ්‍ය ඔස්සේ කිසිවක් නොදන්නා පිරිස් මෙන් ම දන්නා පිරිස් ද විසින් පතුරවනු ලැබෙයි. ජාතික චින්තනය යන සංකල්පය එක් ලිපියක් මගින් එක් රැයකින් ඇතිකරන ලද්දක් නො වෙයි. චින්තනය යන්න අද කවුරුන් කෙසේ කියන්නට තැත්කළ ද මුල දී යොදා ගැණුනේ තෝට් යන ඉංගිරිසි වචනයෙන් කියැවෙන්න සඳහා ය. ජාතික චින්තනය යන වචන මාඕවාදීන් පිරිසක් විසින් කලකට පෙර යොදාගනු ලැබුයේ ද තෝට් යන්නට සමාන අදහසකින් ය. එසේ යොදා ගැණුනු වචනයක් සංකල්පයක් බවට පත්වූයේ අවුරුදු කිහිපයකට පසුව ය. වචනයක්, අදහසක් විකාශය වී සංකල්පයක් බවට පත්වීමේ කතාව අසූවේ දශකයේ අගභාගයේ දිවයින පුවත්පතෙහි ජාතික චින්තන විවාද ඔස්සේ සටහන් වී ඇත. පේරාදෙණි විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අමරතුංග වැන්නන් ඊනියා සභ්‍යත්ව විඥාන ගැන ලිවීමට පළමුව මේ විවාද කියවන්නේ නම් මැනවි. සිංහල සංස්කෘතියෙහි ලක්ෂණයක් හේතුකොටගෙන සිංහලයන්ට වඩා ගෝචරවන්නේ විසිරුණු කවි සංකල්පනා මිස ප්‍රවාදාත්මක සංකල්ප නො වෙයි. සිංහලත්වයට හිමි තැන අහිමිකිරීමෙහි ලා මේ කරුණ ද ප්‍රයෝජනයට ගනු ලැබෙයි.

අද ශ්‍රී ල නි පක්ෂයට මෙන් ම ජනතා විමුක්ති පෙරමුණට ද ජාතික චින්තන මතවාදවල බලපෑමෙන් නිදහස්විය නො හැකි ය. ශ්‍රී ල නි පක්ෂයේ අනාගතය තීන්දු කෙරනු ඇත්තේ පක්ෂය මේ මතවාදවලට කෙසේ ප්‍රතික්‍රියා කරන්නේ ද යන්න මත ය. අවාසනාවකට චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ නායකත්වය යටතේ පක්ෂය ජාතික මතවාදවලින් ඉවතට ගමන් කරයි. බටහිර නූතනත්වය විසින් බිහිකෙරුණු මතවාද මෙරටට නො ගැලපෙන බවට ක්‍රමයෙන් මෙරට පැතිර යන මතයක් වෙයි. මෙරට උගත්තු බටහිර නූතනත්වයේ අංග විකල දරුවෝ වෙති. ඊළඟ පරම්පරාවට මේ අංග විකලත්වයෙන් මිදිය හැකිවනු ඇත්තේ ජාතික මතවාද ඔස්සේ පමණකි. ජවිපෙ ජාතික මතවාද දිශාවට හැරීම හොඳ ප්‍රවණතාවයකි. එහෙත් එය සම්පූර්ණ වී නැත. ජවිපෙ ජාතික මතවාද දෙසටත් ශ්‍රී ල නි පක්ෂය ඒ මතවාදවලින් ඉවතටත් ගමන්කිරීමේ ප්‍රතිඵලය වනු ඇත්තේ යථාකාලයේ දී ජවිපෙ සන්ධානයේ ප්‍රධාන පක්ෂය බවට පත්වීම ය ~

© Prof. Nalin De Silva